කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2015

2020 පෙබරවාරි - අප්‍රේල්

මානව ශාස්ත්‍ර පීඨය

බෞද්ධ සංස්කෘතිය

බෞද්ධ මූලාශ්‍රය හා සාහිත්‍යය අධ්‍යයනය BUCU E 1025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1. බුද්ධචරිතය ආගමික ශාස්තෘත්වයේ අනුපමේය ප්‍රතිමූර්තියක් වූ අයුරු දීඝනිකායේ මහාපරිනිබ්බාන සූත්‍රය ඇසුරින් ප්‍රමාණ කරන්න.

2. සුඛිත මුදිත සමාජ පසුබිමක් ගොඩනැඟීමෙහිලා රජතුමා සතු සංවිධාන කුශලතාව ප්‍රබල සාධකයක් වන අයුරු කූටදන්ත සූත්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.

3. බෞද්ධ සමාජ චින්තාව අනුදක්නා ගෘහස්ථ ප්‍රතිපදාව දීඝනිකායේ සිගාලෝවාද සූත්‍රාගත ඉගැන්වීම් ඇසුරින් විභාග කරන්න.

4. දීඝනිකායේ සක්කපඤ්ඤ සූත්‍රයේ මූලික ව්‍යුහය දක්වා සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ විග්‍රහය අධ්‍යයනය කිරීමේ ප්‍රාමාණික මූලාශ්‍රයක් ලෙස එහි වැදගත්කම පෙන්වා දෙන්න.

5. භික්ෂු ජීවිතයේ පරමාර්ථ සාධනයෙහිලා සේඛියා ධර්ම කෙතෙක් දුරට උපස්ථම්භක විදැ'යි සකාරණව පෙන්වා දෙන්න.

6. ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික ප්‍රවර්ධනය කෙරෙහි ජාතකකථාවන්ගේ බලපෑම පිළිබඳ විමර්ශනයක යෙදෙන්න.

7. මහාකාව්‍ය ආකෘතිය ඇසුරින් බෞද්ධ සංස්කෘතික සංකල්ප ප්‍රතිනිර්මාණයෙහිලා කාව්‍යශේඛර කතුවරයාණන් දක්වා ඇති කුශලතාව අගය කරන්න.

8. හුදී ජන ප්‍රසාදය ජනනය කිරීමේ මාධ්‍යයක් වශයෙන් වංශකථාවන්ගේ භාවිතය කෙතෙක්දැ'යි ථූපවංසය ඇසුරින් සාකච්ඡා කරන්න.

9. පොදුජන විඥානය තුළ බොදු බැතිය වඩා වර්ධනය කරනු පිණිස බුදුගුණ අලංකාරයේ කවර ප්‍රයෝග බලපා ඇද්දැ'යි විමසන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට ප්‍රමාණවත් විවරණ සපයන්න.

    i. බුත් සරණ

    ii. කෝසල සංයුත්තය

    iii. ලෝවැඩ සඟරාව

    iv. අරියපරියෙසන සූත්‍රය

********************************